සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

**06 ශ්‍රේණිය** 

# චිත්‍ර කලාව

**කාලය පැය 02 යි.**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි.

- මෙම ප්‍රශ්න පත්‍රය ලිඛිත සහ ප්‍රායෝගික වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය. කොටස් දෙකට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

---

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.




01 ඉහත රූප සටහනෙන් දැක්වෙන්නේ ..................................................................................ආගමික ස්ථානයකි.

02 මෙහි C අක්ෂරයෙන් දැක්වෙන කුළුණු ................................................................................ නමින් හැඳින්වේ.

03 මෙම ගොඩනැගිල්ල මුදුනෙහි උල්වූ තුඩක් සහිත ගෝලාකාර කොටස ............................................ නම් වේ.

04 මෙම වර්ගයට අයත් ආගමික ස්ථානවල චිත්‍ර සහ ...................................................................... දැකිය නොහැක.

05 කුරානයේ පාඨ ................................................................................ බසින් මෙහි බිත්ති මත සටහන් කර ඇත.

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය පහත දැක්වෙන වචන වලින් තෝරා ලියන්න.**

( ස්තූප / දම් / ස්ටෙන්සිල් / හින්දු / කාසි )

06 ආරාධනා පත්‍ර හා සුබ පැතුම් පත්‍ර නිර්මාණය කිරීමේදී .................................................. ක්‍රමය වඩාත් සුදුසු වේ.

07 අලුත් සහල්, මුං ඇට, එළකිරි වැනි දෑ අලුත් මුට්ටියක දමා පොංගල් බත පිළියෙල කරන්නේ ........................................................ භක්තිකයෝ ය.

08 බුදුරජාණන් වහන්සේගේ ශාරීරික හා පාරිභෝගික ධාතූන් වහන්සේලා තැන්පත් කර ....................................... නිර්මාණය කොට ඇත.

09 ........................................................................... භාවිතයට ගෙන සීල් මුද්‍රණ පිටපත් ලබාගත හැක.

10 නිල් වර්ණය හා රතු වර්ණය සමානව මිශ්‍ර කර .......................................... වර්ණය ලබාගත හැකිය.

- පහත දැක්වෙන වචනවලට වඩාත් සම්බන්ධතාවයක් දැක්වෙන වචනය වරහන තුළින් තෝරා ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

( තොරණ / හින්දු කෝවිල / කෝලම් රටා / සකාත් / නත්තල )

11 තෛ ..........................................................................

12 ඉස්ලාම් ..........................................................................

13 බෝධිපූජා ..........................................................................

14 ගෝපුර ..........................................................................

15 මරියතුමිය ..........................................................................

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන කියමන් හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති තිත් ඉර මත යොදන්න.**

16 පරිසරය ස්වාභාවික හා නිර්මිත වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැක. (............)

17 කඩදාසියකින් හැඩතලයක් ඉරා ඒ මත පැස්ටල් තවරා ඇඟිල්ලෙන් පිරිමැද ලබාගන්නා නිර්මාණ ප්‍රකාශන චිත්‍ර ලෙස හඳුන්වයි. (............)

18 නාවා ගෙඩි පහන් දැල්වීම සඳහා විකල්ප මාධ්‍යයක් ලෙස භාවිතයට ගත හැක. (............)

19 කොලාජ් චිත්‍රයක් නිර්මාණය කිරීමට අවශ්‍ය රූපය පැන්සලෙන් ඇඳ ගැනීම නිවැරදි ක්‍රමයයි. (............)

20 පැරණි සිංහල සැරසිලි මෝස්තර වර්ග කිරීමේ දී ඉර හා හඳ දිව්‍ය ගණයට අයත් ලෙස සලකයි. (............)

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- **ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.**
- **දී ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් අඳින්න.**
- **ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.**

---

01 වෙසක් පොහොය දින ඔබ දුටු පන්සල

02 ඔබේ පවුලේ අය සතුටු සාමීචියේ යෙදෙන අවස්ථාවක්

03 කෙළි දෙලෙන් වැව් පිටියක දුව පනින මුව රංචුවක්

04 මල් සහ ගෙඩි භාවිතා කරමින් චීත්ත රෙද්දකට මෝස්තරයක්

05 ඔබ කැමති හැඩතලයක් භාවිතා කරමින් තෑගි දවටනයකට මෝස්තරයක්

06 ''සමනළ තටු'' නැමති ළමා කතන්දර පොතට සුදුසු මුල් කවරයක්

(ලකුණු 60 යි)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | ඉස්ලාම් / මුස්ලිම් | 02 | මිනාර් / මිනාරෙට් | 03 | ශිඛරය / කුඟා / කුම්බා |
| 04 | මූර්ති | 05 | අරාබි | 06 | ස්ටෙන්සිල් |
| 07 | හින්දු | 08 | ස්තූප | 09 | කාසි |
| 10 | දම් | 11 | කෝලම් රටා | 12 | සකාත් |
| 13 | තොරණ | 14 | හින්දු කෝවිල | 15 | නත්තල |

16 ✓ 17 ✗ 18 ✓ 19 ✗ 20 ✓ (2 x 20 = 40)

I කොටසට ලකුණු 40 යි.

II කොටසට ලකුණු 60 යි. මුළු ලකුණු 100 යි.